සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 1
Model Paper - 1

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - (80) 1- පත්‍රය
Information and Communication Technology- (80) Paper - 1

කාලය පැය එකයි. **Our Hour.**

විභාග අංකය .... **Index No: ....**

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයකටම දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි පිළිතුර හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර හෝ තෝරන්න.
- ❖ ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.
- ❖ 1 සහ 11 පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දෙන්න.

01. තොරතුරු වල තිබිය යුතු ගති ලක්ෂණ සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ සැලකීමේ දී

A. තීරණ ගැනීම සඳහා එලෙසින්ම, සෘජුවම යොදා ගත හැකිය.
B. පවතින අයුරින්ම භාවිතයට ගත නොහැකි අසම්පූර්ණ තත්වයක පවතී.
C. තොරතුරු පද්ධතියකින් ලැබෙන ප්‍රතිදාන නිමැවුම තොරතුරු වේ.

සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ

i. A පමණි. ii. B පමණි. iii. A හා C පමණි. iv. A,B හා C සියල්ලම.

02. ක්ෂුද්‍ර සකසනය (Micro Processor) නිපදවීමත් සමග ....පරම්පරාවේ පරිගණක වල ආරම්භය සනිටුහන් කළේ ය.

i. පළමුවන. ii. දෙවන. iii. තුන්වන. iv. සිව්වන.

03. පහත දී ඇති වගුවේ සංදර්ශකය (Monitor) සහ ඉරි කේත කියවනය (Bar Code Reader) සම්බන්ධයෙන් අදාල තීර දෙක නිවැරදිව ගලපා ඇති පේළිය පෙන්නුම් කරන්නේ,

i. Aමගිනි.
ii. Bමගිනි.
iii. C මගිනි.
iv. D මගිනි.

පේළිය	සංදර්ශකය	ඉරිකේත කියවනය
A	ආදාන උපාංග	ආදාන උපාංග
B	ප්‍රතිදාන උපාංග	ආදාන උපාංග
C	ආචයන උපාංග	ප්‍රතිදාන උපාංග
D	ප්‍රතිදාන උපාංග	ආචයන උපාංග

04. දත්ත සන්නිවේදනය සඳහා භාවිත වන මාධ්‍ය සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති අතරින් නිවැරදි වන්නේ කවර ප්‍රකාශය / ප්‍රකාශ ද?

A. සමාවෘත යුගල ගෙතුම් රැහැන් (Shielded Twisted-pair cable) වලට වඩා ප්‍රකාශ තන්තු රැහැන් (Fibre optic cable) වල දත්ත සම්ප්‍රේෂණ සීඝ්‍රතාව වැඩිය.
B. ක්ෂුද්‍ර තරංග වලට වඩා ප්‍රකාශ තන්තු රැහැන් (Fibre optic cable) වල දත්ත සම්ප්‍රේෂණ සීඝ්‍රතාව වැඩිය.
C. වැඩිම දත්ත සම්ප්‍රේෂණ සීඝ්‍රතාවයක් ඇත්තේ සමාක්ෂක යොත් (Coaxial cable) වලටය.

i. A පමණි. ii. A හා B පමණි. iii. A හා C පමණි. iv. A,B හා C පමණි.

05. ස්ථානීය ප්‍රදේශ ජාල (LAN) පිළිබඳව නිවැරදි අදහස දැක්වෙන වගන්තිය වන්නේ කුමක්ද?

i. භූගෝලීය වශයෙන් මහාද්වීප කිහිපයක් පුරා විහිදුණු පරිගණක ජාලයක් වේ.
ii. විවිධ අතුරු මුහුණත් (Interfaces) සහිත වූ දත්ත සන්නිවේදන මාධ්‍ය සමූහයකින් යුක්ත පරිගණක ජාලයක් වේ.
iii. භූගෝලීය වශයෙන් කුඩා ප්‍රදේශයකට සීමා වූ තනි පුද්ගලයෙකුට හෝ ආයතනයකට අයත් පරිගණක ජාලයක් වේ.
iv. දත්ත සන්නිවේදන මාධ්‍යය වශයෙන් ක්ෂුද්‍ර තරංග (Micro wave) පමණක් භාවිත කරන පරිගණක ජාලයකි.

06. 11011101100_2 ද්විමය සංඛ්‍යාව, ෂඩ් දශම වලට හැරවූ විට අගය
i. $DD4_{16}$ වේ ii. $6AC_{16}$ වේ iii. $6DC_{16}$ වේ iv $6EC_{16}$ වේ

07. AC_{16} ෂඩ් දශම සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටක සංඛ්‍යාව වන්නේ
i. 375_8 ii. FD_8 iii. 254_8 iv. 1011_8

08. 3×2^{20} බයිට් (3×2^{20} Byte) ප්‍රමාණය සමාන වන්නේ
i. $3x2^{23}$ Bits. ii. 3x2048 Bits.
iii. 3x2048 KB. iv. 3x8x1024 x1024 KB.

09. A අනුලක්ෂණයේ ඇස්කි අගය 1000001 නම් C වල (ASCII) ඇස්කි අගය
i. 1100111_2 වේ ii. 011111_2 වේ
iii. 011111_2 වේ iv. 1000011_2 වේ

10. X=14_{16} හා Y=1010_2 නම් X - Y හි අගය වන්නේ
i. 1010_2 ii. 1004_{10} iii. 1000_{16} iv. 1100_2

11. 01001001_{BCD} සංඛ්‍යාවෙන් නිරූපණය වන දශමක අගය වන්නේ
i. 49 ii. 73 iii. 94 iv. 146

12. පහත සඳහන් අගයන්ගෙන් BCD අගයක් විය නොහැක්කේ
i. 0111 ii. 1000 iii. 1001 iv. 1010

13.



A=0 ද , B=1 ද නම් ඉහත තාර්කික පරිපථයේ C ප්‍රතිදානය වන්නේ
i. 0 ii. 1 iii. අවිනිශ්චිතය iv. අදාළ නොවේ.

14. පහත දැක්වෙන්නේ A හා B නම් ආදාන දෙකක්ද F ප්‍රතිදානයක්ද සහිත තාර්කික ද්වාරයක සත්‍යතා වගුවකි. මෙම තාර්කික ද්වාරය වන්නේ

ආදාන		ප්‍රදානය
A	B	F
0	0	1
0	1	0
1	0	0
1	1	0

i. OR ය. ii. NOR ය.
iii. AND ය. iv. NAND ය.

15. එකිනෙකට වෙනස් හඬ වල් දෙකක් නිකුත් කිරීම සඳහා නිර්මානය කරන ලද ඉලෙක්ට්‍රොනික සීනුවක ස්විච දෙකක් පවතින අතර එහි ඇතිවූ දෝෂයක් පදනම් කර ගෙන ස්විච දෙකම වසා ඇති විට හෝ ස්විච දෙකම විවෘතව ඇති විට පමණක් ඉන් හඬ නිකුත්වේ. එක් ස්විචයක් පමණක් වසා ඇති විට හෝ විවෘතව ඇති විට ඉන් හඬ නිකුත් නොවේ. සීනුවේ ක්‍රියාවලියට අනුරූප වන සංඛ්‍යාංක තර්කය වන්නේ

i. OR ය.
ii. NOR ය.
iii. XOR ය.
iv. XNOR ය.

16.  තාර්කික ද්වාරයට සමාන වන්නේ

i. 

iii. 

ii. 

iv. 

17.



ඉහත දැක්වෙන තාර්කික පරිපථයට අදාලව Z සත්‍ය වන්නේ පහත දැක්වෙන කුමන අවස්ථා වලදී සලකා බලන්න.

A. X හා Y දෙකම සත්‍ය වූ විට
B. X හා Y දෙකම අසත්‍ය වූ විට
C. X සත්‍ය හා Y අසත්‍ය වූ විට
D. X අසත්‍ය හා Y සත්‍ය වූ විට

ඉහත A,B,C සහ D ප්‍රකාශ අතරින්

i. A හා B සත්‍ය වේ
ii. C හා D පමණක් සත්‍ය වේ
iii. A පමණක් සත්‍ය වේ.
iv. A,C සහ D පමණක් සත්‍ය වේ.

18. වදන් සැකසුම් මෘදුකාංගයක  මෙම රූපයේ පෙන්වා ඇති එකෙල්ල (Alignment) අනුපිළිවෙල නිවැරදිව දක්වා ඇත්තේ

i. වම්,මැද සහ දකුණු එකෙල්ල ලෙසය.
ii. මැද, වම් සහ දකුණු එකෙල්ල ලෙසය.
iii. වම්, දකුණු සහ මැද එකෙල්ල ලෙසය.
iv. දකුණු,මැද සහ වම් එකෙල්ල ලෙසය.

19. අනිල් ඔහුගේ පාසලේ පරිගණක ඉගෙනම් මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා දත්ත පාදක කළමණාකරන පද්ධතියක් සෑදීමට අපේක්ෂා කරයි. මෙම කාර්යය ඉටුකිරීම සඳහා පහත සඳහන් ඒවායින් ඔහුට වඩාත් සුදුසු මෘදුකාංගය නම් කරන්න.

i. වදන් සැකසුම් පැකේජ මෘදුකාංග - (Word Processing Packge Software)
ii. දත්ත සමුදාය කළමණාකරන පද්ධති මෘදුකාංග-(DataBase Manegement System)
iii. විද්‍යුත් ප්‍රදර්ශක සහ චිත්‍රක මෘදුකාංග - (Presentation and Graphic Software)
iv. පැතුරුම්පත් පැකේජ මෘදුකාංග - (Spreadsheet Packge Software)

20. ශිෂ්‍යයින් හත් දෙනෙක් ගණිත පරීක්ෂණයකදී ලබාගත් ලකුණු ප්‍රතිශත දැක්වෙන ඉලෙක්ට්‍රොනික වැඩපතක කොටසක් රූපයේ දැක්වේ. ඔවුන් අතරින් අඩුම වශයෙන් ලකුණු 50 ක් ලබාගෙන ඇති සිසුන් "PASS" ලෙසත් ඊට අඩු ලකුණු ලබා ඇති සිසුන් "FAIL" ලෙසත් ඇගයීමට ලක් කෙරේ. C තීරයේ පහලට පිටපත් කල විට "PASS" හෝ "FAIL" යන ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා C2 කෙටුවේ (Cell) ලිවිය යුතු සූත්‍රය පෙන්වා ඇත්තේ කිනම් පිළිතුරේද?

	A	B	C	D
1	Name	Maths Marks	Status	
2	Amal	78		
3	Anil	62		
4	Aruna	24		
5	Amara	40		
6	Ashen	92		
7	Amali	56		
8	Amila	84		

i =IF(B2>50,"PASS","FAIL")
ii =IF(B2>=50, "FAIL","PASS")
iii =IF(B2<50,"FAIL" ,"PASS")
iv =IF(B2<=50,"FAIL" ,"PASS")

21. වදන් සැකසුම් මෘදුකාංග අතුරු මුහුනතක ඇති මෙම සංකේත සහිත බොත්තම් අතරින් බොත්තමෙන් කෙරෙන කාර්යය වන්නේ

i. කවුළුව පරිගණක තිරයෙන් ඉවත් කිරීමයි.
ii. කවුළුව පරිගණක තිරයේ ප්‍රමාණයට වඩා විශාල කිරීමයි.
iii. කවුළුව පරිගණක තිරයේ නොපෙනෙන ලෙස කාර්ය තීරුව මත හකුලා දැමීමයි.
iv. කවුළුව පරිගණක තිරයේ ප්‍රමාණයට වඩා කුඩා කිරීමයි.

22. සිසුන් 2000ක් ඉගෙනුම ලබන එක්තරා විශ්ව විද්‍යාලයක ඒ ඒ අංශ අනුව සිසුන්ගේ ව්‍යාප්තිය, දී ඇති ත්‍රිමාන වට චිත්‍රක ප්‍රස්තාරය මගින් පෙන්වයි. ඒ අනුව
පහත නිගමනයන් ගෙන් කවරක් අසත්‍ය වේද?



i. ජීව විද්‍යා අංශයේ සිසුන් ගණන 500ට වැඩිය.
ii. භෞතික විද්‍යා අංශයේ සිසුන් ගණන 500 ට වැඩිය.
iii. වෛද්‍ය අංශයේ සිසුන් ගණන 500 ට වැඩිය.
iv. ඉංජිනේරු අංශයේ සිසුන් ගණන 500 අඩුය.

23. දත්ත සමුදාය කළමනාකරණයේදී වගු දෙකක් අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා එම වගු අතර තිබිය යුතු ලක්ෂණයක් වන්නේ

i. වගු දෙකෙහි කිසිම ක්ෂේත්‍රයක් සමාන නොවීම.
ii. වගු දෙකෙහි එක් ක්ෂේත්‍රයක් හෝ අනිවාර්යයෙන්ම සමාන වීම.
iii. වගු දෙකෙහි සියළු ක්ෂේත්‍රයන් අනිවාර්යයෙන්ම සමාන වීම.
iv. වගු දෙකෙහි තිබිය යුතු ක්ෂේත්‍ර ගණන සමාන වීම.

24. ඉලෙක්ට්‍රොනික වැඩ පතක (Work Sheet) කොටුවක් (Cell) තුලට ඇතුලත් කල විට සත්‍යයි (True) යන්න ප්‍රත්‍යාගමනය (return) කරනු ලබන්නේ පහත සඳහන් කවර ප්‍රකාශනය මගින්ද?

i = 1 > 1 මගිනි.
ii. = 6 <> (1 + 2 + 3) මගිනි.
iii. = Not(1 + 2 + 3 = 6) මගිනි.
iv. =And(1 + 1 =2,1 - 1 = 0) මගිනි.

25. දත්ත සමුදායක් සැකසීමේදී නම් ඇතුළත් කරන දත්ත ක්ෂේත්‍රයට අදාල (Field) දත්ත ස්වරූපය ලෙස (Data type) Text වෙනුවට Memo භාවිත කිරීමේ අවශ්‍යතාවයක් වන්නේ

i. ඕනෑම අකුරු ගණනකින් යුත් නමක් ඇතුළත් කළ හැකි වීම
ii. Capital අකුරු සහිත නම් ඇතුළත් කළ හැකි වීම
iii. simple අකුරු සහිත නම් ඇතුළත් කළ හැකි වීම
iv. පරිගණක මතකය අනවශ්‍ය ලෙස වෙන් කර තබා ගැනීම

26. පරිගණක ක්‍රමලේඛනයේදී 5*(5 * 3 - 6 + 2 * 5 /2 - 4) යන ප්‍රකාශනය ඇගයීමේ දී භාවිත වන ප්‍රාථගාමී අනුපිළිවෙල (Precedence of order) අනුව නිවැරදි පිළිතුර ලබා ගැනීමට උචිත ගණනය කිරීම පෙන්නුම් කරන්නේ

i	5 * (15 - 6 + 5 - 4)	= 5 *10	= 50	මගිනි.
ii.	5 * 5 * 3 - 6 + 2 * 4 / 2-4	=75 - 6 + 8 / 2 - 4	=77 / 2 - 4	= 34 . 5 මගිනි.
iii.	5 * (15- 6 + 2 * 5 / 2 - 4)	=5 * 11 * 5 / 2 - 4	=275 / 2 - 4	=133 . 5 මගිනි.
iv	5 * (15- 6 + 2 * 5 / 2 - 4)	=5 * (11 * 5 / 2 - 4)	=5 * (55 / 2- 4)	=117 . 5 මගිනි.

27. පහත දැක්වෙන ව්‍යාජ කේතයේ (pseudo code), අවසාන ප්‍රතිදානය වන Z හි අගය කොපමණද?

```
Begin
    a = 1
    b = 1
    While  a <= 5
            a = a + 1
            b = b + 2
            Z = a + b
    End while
    Display Z
End
```

i. 21 කි.
ii. 14 කි.
iii. 07 කි.
iv. 13 කි.

28.

A තීරුව	B තීරුව
X - වරණය (Selection)	P - දී ඇති කොන්දේසියක් තෘප්තව පවතින තුරු උපදෙස් අනුක්‍රමයක් පුනරාවර්තනය කරන්නා වූ ක්‍රමලේඛයකි.
	Q - උපදෙස් අනුක්‍රමයක් නොකඩවා ක්‍රියාත්මක කරනු ලබන කමුලේඛ කොටසකි.
Y - පුනර්කරණය (Repetition)	R - ප්‍රතිදානයන් දෙකක් අතරින් සුදුසු එක් ප්‍රතිදානයක් තේරීමට භාවිත කරන කොන්දේසියකි.
	S- දෙනු ලබන විධානයක් ඔස්සේ පරිගණකය තුල ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන්නා වූ ක්‍රමලේඛ කොටසකි.

ඉහත සඳහන් වගුවේ A සහ B යන තීරු වල ඇති අන්තර්ගතයන් පිළිබඳව නිවැරදි සම්බන්ධතාවයක් ඉදිරිපත් කර ඇත්තේ

i X සමග R සහ S
ii. Y සමග P සහ Q
iii. X සමග R සහ Y සමග P
iv. Y සමග R සහ X සමග P

29. රූප සටහන මගින් නිරූපිත ගැලීම් සටහන තුලින් ප්‍රතිදානය කෙරෙන අගය

i. 4 වේ.
ii. 3 වේ.
iii. 0 වේ.
iv. 1 වේ.



30. Z, a සහ b යනු නිඛිල විචල්‍යයන් නම් පහත සඳහන් ක්‍රමලේඛ කේතය

```
a = 10
b = 3
Do While  b <= 5
        a = a - 1
        b = b + 1
        Z = a + b
Loop
```

i. වාර දෙකක් ක්‍රියාත්මක වේ.
ii. කිසි විටක ආරම්භ නොවේ.
iii. කිසි විටක අවසාන නොවේ.
iv. වාර තුනක් ක්‍රියාත්මක වේ.

31. පරිගණක අධාරක තොරතුරු පද්ධතියක් එකවරම ප්‍රායෝගිකව භාවිතයට ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු ඇතුළත් පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

a. පද්ධතිය තුළ ඇති ඒකකයන්ට පරිගණක ආධරක පද්ධතිය අනුගත කිරීමට හැකිද යන්න.
b. නව පද්ධතියේ දෝෂ (bugs) ඇත්ද යන්න.
c. සත්‍ය තොරතුරු පද්ධතියට ඇතුල් කළ පසු නිවැරදි ප්‍රතිදානය ලැබේද යන්න.
d. හස්තීය (manual) පද්ධතියේ පැවති දුර්වලතාවන් මගහැරිය හැකිද යන්න

i. b, c සහ d ය. ii. a, b සහ c ය. iii. a, c සහ d ය. iv. සියල්ලම ය.

32. වෙළඳ සමාගමක උපක්‍රමශීලී තීරණ ගැනීමේදී ඉහල මට්ටමේ කළමණාකරුවන් විසින් භාවිත කරන තොරතුරු පද්ධතිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද?

i. තීරක සහායක තොරතුරු පද්ධතිය - (Decision Support Information System)
ii. විධායක සහායක තොරතුරු පද්ධතිය - (Executive Support Information System)
iii. කළමණාකරන තොරතුරු පද්ධතිය - (Management Information System)
iv. ගණුදෙනු තොරතුරු පද්ධතිය - (Transaction Information System)

33. තොරතුරු පද්ධති සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති වලින් වඩාත් නිවැරදි වගන්තිය වන්නේ

i. නිරන්තරයෙන් ලැබෙන දත්ත එම අවස්ථාවේ දීම සැකසීමට භාජනය කර තොරතුරු සම්පාදනය කිරීම තත්‍ය කාල සැකසීමයි. - Real Time Processing
ii. යම් නිශ්චිත කාල සීමාවක් තුල එක් රැස් කරන දත්ත කාණ්ඩ වශයෙන් ගෙන සැකසීම යාවත්කාලීන සැකසීමයි. - On Line Processing
iii. ආයතන කළමණාකරුවන්ගේ උපදෙස් මත ජ්‍යේෂ්ට ක්‍රමලේඛකයින් විසින් ශක්‍යතා අධ්‍යයනය (Feasibility Study) සිදුකරනු ලබයි.
iv. නව පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසුව පද්ධති විශ්ලේෂණය සිදුකර අවශ්‍යතා හඳුනා ගනු ලබයි.

34. HTML භාවිතයෙන් ලියන ලද වෙබ් පිටුවක් මත අංක සහිත ලැයිස්තුවක් නිරූපනය කිරීමට අදාල වන HTML Tags මොනවාද ?

i. <html> හා </html> ය. ii. හා ය.
iii. <uli> හා </uli> ය. iv. හා ය.

35. වෙබ් අඩවියක ප්‍රධාන පිටුව සමග (Index Page) සමග තවත් පිටුවක් සම්බන්ධ කිරිමේදි (Link) භාවිතා කරනු ලබන Tag එක පෙන්නුම් කරන්නේ

i. <link = “URL”> ii. <link> “URL” </link>
iii. <a href = “URL”> iv. <Weblink> = “URL” </Web>

36 A - Worms B - Spyware C - Viruses D - Trojans

අන්තර් ජාලයට සම්බන්ද කර ඇති පරිගණකයන සාමාන්‍ය ක්‍රියාකරින්වය අඩාල කල හැකි වනුයේ

i. C සහ D ට පමණි ii. B ට පමණි
iii. C ට පමණි iv. A, B, C සහ D යන සියල්ලටම ය

37. නිවැරදි වගන්තිය තෝරන්න.

i. Digital Versatile Disk (DVD) එකකට සංයුක්ත තැටියකට (CD) වඩා අඩු ධාරිතාවක් ඇත.
ii. Pen Drive එකකට දත්ත ලිවිය හැක්කේ එක් වරක් පමණි.
iii. චුම්බක පටි (Magnetic Tape) වල විශාල ප්‍රමාණ වලින් දත්ත ගබඩා කල හැකි අතර ඒවා උපස්ථ ආචයනයක් සේ (Backup Storage) භාවිතයට වඩාත් සුදුසු වේ.
iv. දෘඩ ඩිස්කයක (Hard Disk) ප්‍රවේශ කාලය (Access Speed) සෑම කල්හිම චුම්බක පටියක එම කාලයට වඩා අඩුවේ.

38. "A-One Computers" සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂවරයාට අන්තර් ජාලය හරහා අනය අනවසර පිවිසුම් වලින් ඔහුගේ පරිගණකය ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා වඩාත්ම සුදුසු පියවර වන්නේ

i. ප්‍රති වෛරස් මෘදුකාංගයක් (antivirus software) පරිගණකය තුල ස්ථාපනය කිරීම
ii. ෆයර්වෝල් (Firewall) එකක් ස්ථාපනය කිරීම
iii. මෙහෙයුම් පද්ධතියෙහි අනුවාදය (Version) උත්ශ්‍රේණි ගත (Upgrade) කිරීම
iv. අන්තර් ජාලය භාවිතයෙන් වැලකී සිටීම

39. නිදහස් මෘදුකාංග (Open Source Software) භාවිතය පිළිබඳ වර්තමාන සමාජයේ වැඩි පෙළඹවීමක් හා නැඹුරුතාවයක් ඇතිවෙමින් තිබේ. එමගින් සමාජයට හා රටකට අත්වන වාසි වන්නේ

a. වියදමකින් තොරව මෘදුකාංග භාවිතා කිරීමේ හැකියාව
b. එම මෘදුකාංග වැඩි දියුණු කර අපට ගැලපෙන ආකාරයට භාවිතා කිරීමේ හැකියාව
c. මෘදුකාංග සඳහා පිට රටට ඇදී යන විනිමය ඉතිරි කරගත හැකිවීම
d. එම මෘදුකාංග ඉලක්ක කරගත් වෛරස් ප්‍රමාණය වැඩිවීම

i. a හා b පමණි.
ii. a හා c පමණි.
iii. a, b හා c පමණි.
iv. ඉහත සියල්ලම.

40. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුල ලබා ගන්නා සීග්‍ර දියුණුවත් සමග ශ්‍රී ලංකාව ඉ-යහපාලනය (e-Governance) කරා යොමුවෙමින් පවතී. ඉ-යහපාලනය පිළිබඳව <u>සාවද්‍ය</u> වගන්තිය කුමක්ද ?.

i. ඉ-යහපාලනය (e-Governance) රාජ්‍ය සේවාවන් වැඩි දියුණු කිරීම පිළිබඳව කටයුතු කරයි.
ii. ඉ-යහපාලනය (e-Governance) රාජ්‍යය පිළිබඳ තොරතුරු සාමාන්‍ය වැසියන්ට ලබා ගැනීමේ හැකියාව ලබාදෙයි.
iii. ඉ-යහපාලනය (e-Governance) රජයට තම ජාතික අය-වැය පියවා ගැනීමට මුදල් රැස් කරන මාර්ගයකි.
iv. ඉ-යහපාලනය (e-Governance) පුද්ගලයින්ට ශු ගමන් වලින් තොරව රජයේ සේවාවන් ලබා ගැනීමට උදව් වේ.